දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
DISTANCE AND CONTINUING EDUCATION UNIT – UNIVERSITY OF RUHUNA

සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි ප්‍රථම භාග (බාහිර) පරීක්ෂණය - 2014 පෙබරවාරි/මාර්තු
Bachelor of Arts Degree (External) Part I Examination - February/March 2014

සිංසා 2.2 - සිංහල නාට්‍ය හා රංග කලාව
SLG 2.2 - Sinhala Drama and Theatre

කාලය පැය තුන යි

එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු විය හැකිය.

---

## I කොටස

01. "නාට්‍යය වනාහි සාමූහික කලා මාධ්‍යයකි" මේ කියමන වෙනත් කවර හෝ කලා මාධ්‍යයක් හා සසඳමින් පැහැදිලි කරන්න.

02. රූපණය යනු කුමක් දැයි පහදා රූපණ ශිල්පීන්ගේ කාර්ය භාරය විස්තර කරන්න.

03. රංග භාණ්ඩ පිළිබඳ හැඳින්වීමක් කොට ඒවායේ ප්‍රයෝජන පහදන්න.

04. "සොකරි යනු යාතු කර්ම විශේෂයක් වුවත් ජන නාට්‍යයක ලක්ෂණ එහි නො අඩුව දක්නට ලැබේ" විමසන්න.

05. පහත දැක්වෙන මාතෘකා පිළිබඳ කෙටි විවරණ සපයන්න.
    1. ආංගික අභිනය
    2. පසුබිම් සැරසිලි
    3. නාට්‍ය නිෂ්පාදක
    4. රංග ශෛලිය

## II කොටස

06. නාට්‍යකරුවකු වශයෙන් කාලිදාසයන්ගේ කුසලතාව ප්‍රකට වන අයුරු සකුන්තලා නාට්‍ය ඇසුරින් පෙන්වා දෙන්න.

07. "රත්නාවලී ශෘංගාරය රසය ඉක්මවා හාස්‍ය රසය ඉස්මතු කරන නාට්‍යයකි" ඔබේ අදහස් දක්වන්න.

08. "සිංහබාහු නාට්‍යයෙහි සමස්ත කථාව ම විකාසනය වන්නේ එහි ප්‍රධාන චරිත නිදහස් පුද්ගලයන් සේ හිතා මතා කරන ක්‍රියාවල නියත ඵලයක් වශයෙනි" විමසන්න.

09. "ආංගික, සාත්වික හා ආහාර්ය යන අභිනයන්හි ප්‍රකාශනාර්ථ කුළුගන්වන්නේ භාෂාව මූලික කරගත් වාචිකාභිනය මගිනි" සාකච්ඡා කරන්න.

**************************